# ළමයා සහ කතාකරන බෝනික්කා



ආර්.එම්.සෙනුරි තත්සරණි රත්නායක

| | | |
|---|---|---|
| **කෘතියේ නම** | **:-** | **ළමයා සහ කථා කරන බෝනික්කා** |
| **කතෘගේ නම** | **:-** | **ආර්. එම්. සෙනුරි තත්සරණි රත්නායක** |
| **කතෘ අයිතිය ඇතුළු විස්තර** | **:-** | **ISBN-978 - 624 - 208 - 297 - 4** |
| **කතෘගේ වෙනත් කෘති** | **:-** | **නරි රාළට පාඩමක්**<br>**හිත හොඳ ඈන්**<br>**මී වද තිත්ත වූ වළස් පැංචා** |
| **කෘතිය පළ කරන දිනය** | **:-** | **2025-02-08** |

# පිදුම

මෙම පොත සැදීමට මා හට

නිරන්තරයෙන් ශක්තියක් වූ මාගේ

දෙමාපියන්ටත්, සහෝදර,

සහෝදරියන්ටත්, පන්තිභාර ගුරු

මෑණියන්ටත්, උපදෙස් ලබාදුන්

සෙනවිරත්න සර්ටත් මෙම පොත

ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දවසක් ගැහැණු
ළමයෙක් ඇයගේ මව
සමග සෙල්ලම්
බඩු සාප්පුවකට ගියා.





විවිධ ආකාරයේ සෙල්ලම්
බඩු එම සාප්පුවේ
පිරී තිබුණා

ඇයට තෝරා ගත්නේ
කුමක්දැයි සිතා ගැනීමට
නොහැකි ය.



ඒ තරම් ලස්සන
සෙල්ලම් බඩු තිබෙන
නිසා.

සාප්පුවේ තිබු සෙල්ලම්
බඩුවලින් ඇයගේ
හිතගියේ
බෝනික්කෙකුටයි.






ඇය බෝනික්කා අතට
ගෙන මව ළඟට ගෙන
ගියා.

“අම්මේ මට මේ
බෝනික්කාව ඕනේ”.
අම්මා මුදල් දී ඇයට
බෝනික්කා ලබා දුන්නා.

ඇය ආශාවෙන්
බෝනික්කාව රැගෙන මව
සමඟ නිවසට ගියා.
ඇය සෑම දිනක් ම ගත
කළේ මේ බෝනික්කා
සමඟය.





එක දවසක් ඇය නින්දට
යන විට බෝනික්කා
ළඟට ගෙන තුරුල් කර
ගත්තා. ටික වේලාවක්
ගිය පසු බෝනික්කා
ඇයට කතා කළා.

"ළමයෝ ඇය නැඟිට වටපිට
බැලුවා කවුද කියලා.
ඒත් කවුරුත් හිටියේ නෑ.
"කවුද මට කතා කළේ?

"ළමයෝ"
"අනේ, කවුද මට කතා
කරන්නේ"
"ළමයෝ මමයි කතා කළේ"
ළමයා බියට පත් වුණා.

"ආ ඕ...ඔයා කතා කරනවාද?
"ඔව් ළමයෝ මට කතා
කරන්න පුළුවන්."
ඇය පුදුමයට පත් වී බලා
සිටියා.



ඇය බෝනික්කා සමඟ
කතා කරා.

''බෝනික්කෝ ඔයා හරි ලස්සනයි.
ඔයාගේ නම මොකක්ද?



''මගේ නම බෙලා''
''හරිම ලස්සන නමක්''
''මගේ නම මලිති අද ඉඳලා
අපි දෙන්නා හොඳම යාළුවෝ''
එදා ඉදලා ඒ දෙන්නා සතුටින්
කාලය ගත කලා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

වියාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්